Uva Wellassa University

"ජාතික සංවර්ධනයේ සාඩම්බර දායකයෙකු වන්න"

# ප්‍රසම්පාදන දැන්වීම
# ශ්‍රම සේවාව සැපයීම

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් විශ්වවිද්‍යාලය සඳහා පහත සේවාව සැපයීමට සුදුසුකම්ලත් සැපයුම්කරුවන්ගෙන් ලංසු පත්‍රයට අනුව මිල ගණන් කැඳවනු ලැබේ.

| ලංසුවේ නම | ලංසු අංකය | ලංසු පත ලබා ගැනීමට ගෙවිය යුතු මුදල (ආපසු නොගෙවන) (රු.) | ලංසු ඇපකරය (රු.) | ලංසු පත් නිකුත් කරන කාල සීමාව | ලංසු පත් විවෘත කිරීම |
|---|---|---|---|---|---|
| ශ්‍රම සේවා සැපයීම 2025 -2026 | UWU/GA/ NCB/2025/11 | 10,000.00 | 900,000.00 | 2025.08.05 - 2025.08.26 | 2025.08.27 ප.ව. 2.00 |

ඉල්ලුම්කරුවන් පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාර්යාල වේලාවන් තුල ලංසු පත් මිලදී ගැනීම සඳහා ලිඛිත අයදුම්පත සමඟ එක් ලංසුපතක් ලබා ගැනීම සඳහා ඉහතින් සඳහන් කර ඇති ආපසු නොගෙවනු ලබන මුදල, ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ සරප් වෙත ගෙවා ලබා ගත් රිසිට්පත හෝ විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක 3114820 ට ලැබෙන සේ ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් මුදල් ගෙවා ලබා ගත් රිසිට්පත ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (සාමාන්‍ය පාලන අංශය) වෙත ඉදිරිපත් කිරීමෙන් ඉහත කාල සීමාව තුළ ලංසු පත් ලබා ගත හැකිය. ලංසු පත් http://www.uwu.ac.lk/procurement/ යන විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුව මඟින්ද ලබා ගත හැකිය. විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුව මඟින් ලංසු පත් ලබාගන්නා ඉල්ලුම්කරුවන් , "ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය" නමින් නිකුත් කල ඉහත සඳහන් ලංසු පත් වලට අදාළ බැංකු ඇපකරයක් සමඟ හෝ විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක 3114820 ට ලැබෙන සේ මුදල් ගෙවා ලබා ගත් රිසිට්පත ලංසු පත සමඟ අමුණා එවිය යුතුය. ලංසු පත් මිලදී ගැනීමට පෙර ඉල්ලුම්කරුවන් හට නොමිලයේ ලංසු ලත් පරික්ෂා කල හැකිය. පූර්ව ලංසු රැස්වීම 2025 අගෝස්තු මස 13 වන දින පෙ.ව. 10.00ට ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ, පරිපාලන ගොඩනැගිල්ලේ කමිටු කාමරයේදී පැවැත්වේ.

මිල ගණන් ඉදිරිපත් කිරීම ඉහතින් දක්වා ඇති දිනයන් හී ප.ව.2.00 ට හෝ ඊට පෙර සිදු කල යුතු අතර මිල ගණන් ප.ව.2.00 පසු වූ වහාම විවෘත කරනු ලැබේ. විවෘත කිරීමේ අවස්ථාවට ඉල්ලුම්කරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට (බලයලත් ලිපියක් සමඟ) සහභාගි විය හැක. ලංසු පත් බහාලන ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ ලංසු අංකය සඳහන් කළ යුතු අතර මිල ගණන් ඉදිරිපත් කිරීම ලියාපදිංචි තැපෑලෙන් සභාපති, ප්‍රසම්පාදන මණ්ඩලය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, පස්සර පාර, බදුල්ල යන ලිපිනයට එවිය යුතුය. නැතහොත් මෙම ලිපිනයට ගෙනවිත් ලේඛකාධිකාරි කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය.

වැඩි විස්තර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (සාමාන්‍ය පාලන අංශය) 055-2226470 දුරකථන අංකයෙන් ලබා ගත හැකිය.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
බදුල්ල